**නැවත පදිංචි කරවීමේ අධිකාරිය - 2015**

------------------------------------------------

නැවත පදිංචි කරවීමේ අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 අංක 09 දරන නැවත පදිංචි කරවීමේ අධිකාරිය පනතේ අංක 20(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1800) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචි කරවීමේ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **අධිකාරියේ මෙහෙයුම් කටයුතු අවසන් කිරීම**

2016 පෙබරවාරි 29 දිනැති අංක බීඩීඑච්ආර්ඩී/145/සීඑම්02/2016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අධිකාරියේ මෙහෙයුම් කටයුතු 2016 මාර්තු 24 දින වන විට අවසන් කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2016 ඔක්තෝබර් 27 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අධිකාරියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ පදනම මත පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි.

**2.2.2** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව අධිකාරිය වෙත වෙනත් ආයතන වෙතින් පවරා තිබුණු වත්කම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාල වූ වටිනාකම රු.1,749,444 ක් වූ ක්‍රමක්ෂය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ප්‍රතිඵලයට ගලපා දක්වනු වෙනුවට ආයෝජන කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.115,230 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.513,936 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.629,166 ක වර්ධනයක් නිරීක්ෂණය විය. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන , නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය වෙතින් අධිකාරිය වෙත ලැබී තිබුණු ප්‍රදානයන් විශේෂයෙන් හේතුවී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

අධිකාරිය වෙත වෙනත් ආයතන වලින් පවරාදී තිබුණු මෝටර් වාහන, පරිගණක යනාදි විවිධ ස්ථාවර වත්කම් වර්ග 66 ක් සම්බන්ධ ගිණුම් හා වෙනත් වාර්තා යාවත්කාලීනව පවත්වා ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණු බව විගණනයේදී හෙළිදරව් විය. මේ අනුව, අධිකාරියේ කටයුතු අවසන් කිරීම සඳහා එම වත්කම් අදාල ආයතන වෙත ආපසු භාරදීමේදී ගැටළු මතුවීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

**4.2 කාර්ය මණ්ඩල පරිපාලනය**

අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටළු සහගත තත්ත්වයන් පැවතියද පහත සඳහන් පරිදි අවිධිමත් පදනමක් මත නිලධාරීන් බඳවා ගෙන තිබුණු බව විගණනයේදී හෙළිදරව් විය.

(අ) අධිකාරිය විසින් 2014 නොවැම්බර් 01 දින කළමනාකරණ සහකාර තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත සුදුසුකම් සපුරා නොමැති නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි.

(ආ) අධිකාරියේ අභ්‍යන්තර විගණන තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණු නමුත් 2015 ජූලි 15 දින අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන තිබුණු අතර එම පත් කිරීම් සම්බන්ධව වූ ලිපිවල පිටපත් විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි.

(ඇ) 2015 ඔක්තෝබර් 08 වන දින අධිකාරියේ උපදේශකයෙකු වශයෙන් පත් කරන ලද නිලධාරියකු වෙනුවෙන් පැමිණීම සහ පිටවීම සනාථ කර ගැනීමකින් තොරව රු.303,367 ක දීමනාවක් ගෙවා තිබුණි. උපදේශකවරයා බඳවා ගැනීමට අදාල කිසිදු ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

අධිකාරිය විසින් මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය මුලතිව්, වව්නියාව යන දිස්ත්‍රික්ක සඳහා එක් දිස්ත්‍රික්කයකට ක්‍රියාකාරකම් 06 බැගින් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද , එම කාර්යයන් ඉටුකිරීමට අපේක්ෂිත කාලවකවානු ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාකාරකම් ඉටුකර නොතිබුණි.

**5.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තිය පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමේදී එම රැස්වීම් සඳහා මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳව කාර්යසාධන වාර්තාව, මාසික මෙහෙයුම් වාර්තාව, මාසික මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සේවක මණ්ඩල තත්ත්වය දැක්වෙන වාර්තා ආදිය ඉදිරිපත් කළ යුතු වූවත්, එම වාර්තා සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පමණක් පවත්වා තිබුණි.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

අධිකාරියේ 2013 හා 2014 වර්ෂයන් සඳහාවූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට 2015 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව අධිකාරියේ සභාපතිවරයා වෙත වරින් වර වාර්තා කරන ලද අතර පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ආයතනය විසිරුවා හැරීම් පිළිබඳ ගිණුම් පිළියෙල කිරීම. |
| (ආ) වත්කම් පාලනය | අධිකාරියේ කටයුතු හමාර කිරීම සඳහා අදාල ආයතන වෙත වත්කම් භෞතිකව සත්‍යාපනය කළ යුතු වීම. |